# අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
# උසස් අධ්‍යාපන අංශය

## මොරටුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ස්ථාපනය කිරීම.

අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වන කුවේට් අරමුදල විසින් ලබා දෙන ණය ආධාර යටතේ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ, උසස් අධ්‍යාපන අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන මොරටුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ පහත දක්වා ඇති තනතුරු සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2026.02.02 දාතමින් නිකුත් කර ඇති චක්‍රලේඛ අංක 01/2026 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් වශයෙන් මෙම ව්‍යාපෘතිය ස්ථාපිත කොට ඇත. එම ව්‍යාපෘතියේ මුළු වටිනාකම කුවේට් ඩිනාර් මිලියන 10ක් පමණ වේ.

| අනු අංකය | තනතුර | වැටුප් කාණ්ඩය | තනතුරු ගණන |
|---|---|---|---|
| 01 | ප්‍රසම්පාදන විශේෂඥ | PS 3 | 01 |
| 02 | ව්‍යාපෘති ඉංජිනේරු | PS 4 | 01 |
| 03 | අභ්‍යන්තර විගණක | PS 4 | 01 |
| 04 | ව්‍යාපෘති ගණකාධිකාරී | PS 4 | 01 |
| 05 | ව්‍යාපෘති නිලධාරි | PS 6 | 01 |
| 06 | කළමනාකරණ සහකාර | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2026 හි 3.2.3 වගන්තිය අනුව | 02 |
| 07 | කාර්යාල සහකාර | | 01 |
| 08 | රියදුරු | | 01 |

**<u>තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම්</u>**

ඉහත එක් එක් තනතුර සඳහා අවශ්‍ය අවම සුදුසුකම් හා පළපුරුද්ද සම්බන්ධ වැඩිදුර තොරතුරු www.mohe.gov.lk වෙබ් පිටුව මඟින් ලබා ගත හැක.

**<u>සාමාන්‍ය කොන්දේසි</u>**

1. සෑම අයදුම්කරුවෙකු ම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනයට හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.
2. කුවේට් රජයේ හෝ විදේශ ආධාර මත ක්‍රියාත්මක වූ ව්‍යාපෘතියක පළපුරුද්ද විශේෂ සුදුසුකමක් වනු ඇත.
3. තනතුරේ රාජකාරී ඉටු කිරීම සඳහා මනා කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.
4. **වයස් සීමාව** : උපරිම වයස **අවුරුදු 64** හෝ ඊට අඩු වීම.
5. වැටුප :

    I. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2026.02.02 දාතමින් නිකුත් කර ඇති චක්‍රලේඛ අංක 01/2026 අනුව හිමි වැටුප සහ අනෙකුත් දීමනා

    II. කාර්ය සාධනය මත පදනම් වූ වාර්ෂික වැටුප් වැඩිවීම.

**6.**සේවා කොන්දේසි :

වසර 01 ක කාලපරිච්ඡේදයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත පත්කරනු ඇත. වාර්ෂික කාර්ය සාධනය හා සේවයේ අවශ්‍යතාව අනුව එම කාලය වසරින් වසර තවත් වසර දෙකක උපරිම කාලයක් දක්වා දීර්ඝ කිරීම පිළිබඳ ව සලකා බලනු ලැබේ.

**7.** වෙනත් ප්‍රතිලාභ :

I. සේවක අර්ථ සාධක අරමුදල සඳහා සේවාදායකයාගෙන් 8% ක දායකත්වයක් ද, සේවායෝජකයාගෙන් 12% ක දායකත්වයක් ද සහ සේවක භාරකාර අරමුදල සඳහා 3% ක දායකත්වයක් ද සේවායෝජකයා විසින් ද දරනු ඇත.

II. කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2026 අනුව හිමි අනෙකුත් දීමනා.

සුදුසුකම්, පළපුරුද්ද සහ වෙනත් අදාළ තොරතුරු පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරමින් අයදුම්කරු පිළිබඳව තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් ද සහිතව ඔබ විසින් සකස් කරන ලද අයදුම්පත 2026.03.10 දින හෝ ඊට පෙර **ලේකම්, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, උසස් අධ්‍යාපන අංශය, අංක 18, වෝඩ් පෙදෙස, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.** ලියුම් කවරයේ ඉහළ වම් කෙලවරේ ඔබ විසින් ඉල්ලුම්කරන තනතුර සඳහන් කිරීම අත්‍යවශ්‍ය වේ.

සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර ඕනෑම ආකාරයක බලපෑම් කිරීමක් නුසුදුසුකමක් වනු ඇත. එවැනි අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලේකම්**
**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**
**උසස් අධ්‍යාපන අංශය**
**අංක 18, වෝඩ් පෙදෙස**
**කොළඹ 07.**